# ස.ණ.ස. පුවත් කොළඹින්

2020 - මාර්තු - තෙවන කලාපය

දායකත්වය රු 15/-


## වන්දනා චාරිකාව

කේ.ඒ. පියතිලක

02 පිටුව..



03 පිටුව..



## දානමය පිංකම

ප්‍රේමලතා වනිගසේකර

05 පිටුව..



## සමාජවිද්‍යාපති උපාධි ලබති

එම්. රොහාන් ජේ. පෙරේරා

# සාමාන්‍ය ජනතාවගේ ජීවන ගැටලු විසදිය හැක්කේ සැබෑ සමුපකාරයටය.

සමුපකාර ප්‍රසාදිනී ඩෑනිසන් වීරසූරිය



රටේ ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම රජයක මූලික වගකීම් වන අතර, රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශය පමණක් යොදා ගැනීම මගින් නිලබලය ඇති අයට මෙන්ම ධනබලය ඇති අයට අත්වන පහසුකම් සාමාන්‍ය ජනතාවට අත්වන්නේ නැත. මේ නිසා වඩාත් යහපත් පිළියම වන්නේ සමුපකාර අංශය රටක ප්‍රවර්ධනය කිරීමය. ඒ නිසා සමූහයක් වශයෙන් එක්ව ඔවුන්ම මූලධනය සම්පාදනය කර ගනිමින් සුලු හා මධ්‍ය පරිමානයේ කටයුතු ඉටු කර ගැනීමට ඇති ලොව පිළිගත් මහජන සංවිධානය වන සමුපකාරය ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය වන්නේ රජයේ මූලික යුතුකම් මිනිසුන් විසින්ම එක්ව ඉටු කරගන්නා ක්‍රමයක් බැවිනි. මේ නිසා 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ''රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූල ධර්ම'' යටතේ වූ 16(2) (ඉ) වගන්තියට පෞද්ගලික අංශයට අමතරව රාජ්‍ය අංශය හා සමුපකාරය වර්ධනය කිරීම පිලිගෙන ඇතුලත් කර තිබූ නමුත්, වත්මන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 27(2) (ඈ) යටතේ ඇතුලත්ව ඇත්තේ රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය පමණක් බව දන්වමි. එයට සමුපකාර අංශය ඇතුළත් විමේ අවශ්‍යතාවය ද අවධාරණය කරවමු.

සාමාන්‍ය ජනතාව යනු නිලබලය හෝ ධන බලය ඇති අය නොවේ. ජීවන තත්වය ඉහළට ඔසවා ගැනීම සදහා ප්‍රමාණවත් ධනයක් නොමැති කමින් ජීවන අරගලයක යෙදී සිටින මිනිසුන් උදෙසා සමුපකාරය භාවිතාකිරීමේ වැදගත් කම රජයකට අවබෝධ නොවන්නේ, බලය ලත් අයට හෝ ඔවුන්ට උපදෙස් දෙන උසස් පෙළේ වරප්‍රසාදලත් නිලධාරීන්ට හෝ උපදේශකවරුන්ට සිය ජීවන ගැටලු විසදා ගැනීම සදහා සමුපකාරයේ පිහිටක් අවශ්‍ය නොවන නිසා එහි වැදගත්කම අවබෝධ වී නැත. එහෙත් අප සමග ජීවත්වන මිනිසුන්ගේ අවශ්‍යතාවන් ඉටු කර ගැනීම සදහා ඔවුනොවුන්ම එක්ව ඔවුන්ගේ බලය, ශක්තිය හා හැකියාව යොදවා ගනිමින් එම එකමුතුකමින් අපගේම අවශ්‍යතාවන් ඉටු කර ගැනීමේ ලොව පිළිගත් සමුපකාරය පිළිබදව සාමාන්‍ය ජනතාව තුළ වැඩි වැටහීමක් ඇති කොට එය අර්ථ ක්‍රමයක්, ජීවන ක්‍රමයක් බවට පත් කර ගැනීමට මේ වන විට සමුපකාර භාවිතය උපරිමයෙන් සිදු කරනු ලබන සකසුරුවම් හා ණයගනුදෙනු සමුපකාර නායකයින් ගේ වගකීමක් බවට පත් කරගනිමු.

විශේෂයෙන් විවිධ වූ කේෂ්ත්‍ර සදහා සමුපකාර සංවිධාන ක්‍රියාත්මක වන නමුත්, ප්‍රභල වූ පාරිභොගික සමුපකාර පක්ෂ දේශපාලනය නතුවී ඇති සාමාජික ප්‍රජාතන්ත්‍රවාදය ගිලිහී ගොස් ඇති බව සමුපකාර සමාජයම දන්නා කරුණකි. එය සාමාජිකයාගේ අයිතියට පැවරෙන යුගයක් ගැන අපිට සිතන්නට ඉඩක් නැත. එහෙත් අද ජීවන ගැටලු විසදීම සදහා පවුලකට ආදායම් උපදවාගන්නා තත්වයක් ඇති කර දීම සදහා සණස සමිති වලට කළ හැකි මෙහෙවර ඉතාමත් ඉහළය. එනම් මූලධනය සම්පාදනය කරදෙමින් ආදායම් උපදවන පවුලක් බවට පත් කිරීම සදහා සැලසුම් සහගතව කටයුතු කිරීමෙන් සිය ප්‍රදේශයේ සාමාන්‍ය ජනතාවගේ ප්‍රශ්න වලට විසදුම් ලබා දිය හැකිය. විවිධ වූ ස්වංරැකියාවන් කිරීම සදහා ඔවුන්ට අවශ්‍යවන ප්‍රාග්ධනය ලබා දෙමින් මේ සදහා කටයුතු කිරීම සදහා අවශ්‍ය මගපෙන්වීම දිස්ත්‍රික් සංගමය මගින් සිදු කරනු ලැබේ, අවංකව කැපවීමෙන් යුතුව කටයුතු කරනු ලබන සමිතිවල නායකයින් සිය බල ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික ගැටලු වලට ඔවුන් ලබන ආදායමට අමතර ආදායම් ලැබීමට හෝ විශේෂ ව්‍යාපෘති

07 පිටුවට...

## වාර්ෂික චාරිකාව

කුල සෙවන සණස ළමා සමිතියේ වාර්ෂික චාරිකාව 'සුර සරදියෙල් ගම්මානය' නැරඹීම පසුගියදා සිදුකෙරිනි.



# කොටස් හිමියන්ට තුට්ටුවකවත් ලාබයන් නැති ලක්ෂ 25 ක මාසික වැටුප් ලබන සාමාන්‍යාධිකාරීවරයෙක් ඇති SDB බැංකුව

කොටස් හිමි ආරම්භක අධ්‍යක්ෂක ඩෑනිසන් වීරසූරිය

1911 අංක 07 දරණ සමුපකාර ණය දෙන සමිති ආඥා පණත වෙනුවට 1921 අංක 34 දරණ එක්සත් සහකාර සමාගම් පණත සම්මත කිරීමෙන් පසුව පළමු කෝපරේටිව් සෙන්ට්‍රල් බෑන්ක් එක (CCB) 1929 අප්‍රේල් වලදී යාපනයේ දී ද, 1931 පෙබරවාරියේ මහනුවර ද, 1931 අගෝස්තුවලදී කොළඹ ද, 1942 දී මඩකලපුවේ දී ද සමුපකාර මධ්‍යම බැංකු ආරම්භවිය. මේ වන විට මෙරට හැදින්වූයේ ලංකාව නැත්නම් සිලෝන් කියාය. ඒ වන විට ලංකාවට මහ බැංකුවක් තිබුණේ නැත.ලංකාවේ මධ්‍යම බැංකුව සිලෝන් සෙන්ට්‍රල් බෑන්ක් (CCD) නමින් පිහිටුවන විට නම් පටලැවිල්ල නිසා කොපරේටිව් පෙඩරල් බෑන්ක් (CFB) ලෙස ස්ථාපිත විය. මෙම බැංකු පළාත් හා දිස්ත්‍රික් බැංකු වශයෙන් ව්‍යාප්තවිය. 1961 දී මහජන බංකුව වූයේ ඒවන විට ව්‍යාප්තවූ සමුපකාර ඒකාබද්ධ බැකුවයි. සමුපකාරය හා වෙනත් සමිති වෙනුවෙන් ඇති කළ මහජන බැංකුව මේ මුල දන්නා අය කිසිවෙක් දැන් නැතිබවයි පෙනෙන්නෙ.

සමුපකාර භාවිතය අවශ්‍යවන්නේ ධන බලය හා නිලබලය හිමි වරප්‍රසාද ලත් පන්තිය නොවන ආර්ථික අමාරුකම් බහුලවූ සාමාන්‍ය ජනතාවගේ යහපත ඇති කිරීමට මුත් කාලයාගේ ඇවෑමෙන් මහජන බැංකුව ද ධනබලය හා නිලබලය හිමියන්ටම ප්‍රමුඛ සේවයක් සලසන වාණිජ බැංකුවක්ම විය. බැංකු කටයුතු 1911 සිටම සිදුකළ ස.ණ.ස නම් වූ

07 පිටුවට...

## තවත් පිංකමක්...

තුෂාරි විජේසූරිය
සණස වාර්තාකාරිනී

**(යෝ ගිලානං උපට්ඨෙය්‍ය සෝ මං උපට්ඨෙය්‍ය)** බුදුන් වහන්සේ

විල්ලෝරාවත්ත සණස සමිතියේ තරුණ කමිටුව මගින් පසුගියදා හොරණ සීල සුව අරණෙහි වැඩ සිටි ගිලන් භික්ෂුන් වහන්සේලාට ගිලන් පස දානමය පිංකමක් සිදු කරන ලදී. මෙම අවස්ථාවට තරුණ කමිටු සාමාජික සාමාජිකාවන්, ගරු සභාපතිතුමිය ඇතුළු කාරක සභාව, කාන්තා කමිටුවේ සාමාජිකාවන්, කළමණාකාරිණියන් දෙපළ සහ තවත් කිහිප දෙනෙක් සහභාගී වූහ.



# සංවර්ධනයේ මාවත

'මාර්ගයක් දිගේ සංවර්ධනයද' පැමිණෙතැයි කථිකාවක් ඇත. නූතන මාර්ග පද්ධතිය හා සංවර්ධනයේ ව්‍යාප්තිය දෙස බලනවිට පෙරකී කථාව සත්‍යයකි. මාර්ග වැඩිදියුණු වීමත් සමඟ විදුලිය, දුරකථන, ජලය වැනි මිනිසාට අත්‍යාවශ්‍ය වූ යටිතල පහසුකම් රැසක් ඒවා හරහා පැමිණේ. ඕනෑම රටක සංවර්ධන ක්‍රියාවලියට බලපාන සාධක අතර මාර්ග යනු ප්‍රධානතම යටිතල පහසුකමකි.

ලොව දියුණුව පවතින රටවල් දෙස බලන්නෙකුට එම රටවල මංමාවත් ඉදිවී පවත්වා ගෙන යන ආකාරය හොඳින් දැකිය හැක. ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය අභියෝග මැද ජය ගැනීමට නම්, දියුණු මාර්ග පද්ධතියක් නිර්මාණය විය යුතුය. එය වටහාගත් එවකට පාලන බලයේ සිටි නායකයින්, අධිවේගී මාර්ග ව්‍යාපෘති කීපයක් ආරම්භ කොට දක්ෂිණ අධිවේගී මාර්ගය ලාබ ලබමින් පවත්වාගෙන යයි. ඒ අතර කොළඹ කටුනායක අතර අධිවේගී මාර්ගයද ඉදිකොට ජනතා අවශ්‍යතා සඳහා යොදාගෙන ඇත. මේවා රටේ ආර්ථික ප්‍රගමනයට සුබවාදීව බලපා තිබේ.

කලාපයේ සෙසු රටවල් හා සසඳන කල ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතිය යම් තරමක සාධනීය තත්වයක් ඇතිකරගෙන ඇතත්, අපේක්ෂිත සංවර්ධන ඉලක්ක කරා ළඟාවිය නොහැක. ඊට හේතුකාරනා කීපයක් ඇත. ශ්‍රී ලංකා භූමියේ ඉදිවී ඇති මාර්ග, අතුරුමාර්ග, අඩිපාරවල් විවිධ ආයතනවල හිමිකරුවන් වී නඩත්තු කටයුතු කරගෙන යනු ලැබේ. මාර්ග සංවර්ධන අධිකාරියට, පළාත් සභා වලට, පළාත් පාලන ආයතනයන්ට, හා වෙනත් ආයතන වශයෙන් මහවැලි සංවර්ධන අධිකාරියට, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට, හා වනජීවී දෙපාර්තමේන්තුවට මාර්ග අයිතීන් පවරා ඇත. මෙම හේතුව නිසාම ජනතා අවශ්‍යතා ඉටු නොවී ජනතා අසහන උද්ගත වී තිබේ.

ගුවන්තොටුපල වරාය මෙන්ම කර්මාන්ත පුරයන් හා භාණ්ඩ නිෂ්පාදය කෙරෙන ස්ථාන කරා පහසුවෙන් ගමන් කිරීමට මහාමාර්ග පුළුල් ප්‍රවේශ මාර්ග බවට පරිවර්තනය විය යුතුය. ශ්‍රී ලංකා බිමෙහි මාර්ග තදබදය බහුලව පවතී. සංවර්ධනයට රටකට අනර්ථකාරී ලෙස මෙම මාර්ග තදබදය බලපානු ඇත. එසේම එවන් වූ තදබදයට දිනපතා ගොදුරු වන කාර්යාල නිලධාරීන් හා සේවක පිරිසගේ මානසික තත්වයන් කඩාවැටීමෙන් ධනාත්මක සේවාවක් බලාපොරෙත්තු විය නොහැක. මාර්ග පළල් වීම නිසාම වාහන තදබදය අඩුකරලීමට නොහැක්කේ ඊට සමගාමීව වාහනද මාර්ගයට අවතීර්ණය වීමයි.

අධිවේගී මාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක වීම තුළින් සංවර්ධනයට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ඇතිවීමත්, කාර්මාන්ත සේවාවන් සඳහා ව්‍යවසායකයින් පෙළඹවීමටත් අන්තර් ප්‍රදේශ ප්‍රවාහන පහසුකම් ප්‍රවර්ධනය කිරීමටත්, අරමුණු කරගත හැක. මෙවන් අධිවේගී මාර්ග, ඇතිවීමෙන් ගමනට ගතවන කාලය අවමකර ගැනීමටත්, වැයවන ඉන්ධන ප්‍රමාණය අඩුකර ගැනීමටත්, ප්‍රධාන මාර්ග තදබදය අවම කිරීමටත්, ආයෝජනයෙන් වෙළඳපොල පුළුල් කිරීමටත්, සංචාරක කර්මාන්තය, ප්‍රවේශ මාර්ග ඇතිවන ස්ථාන ආර්ථික මධ්‍යස්ථාන වීම හා ඉඩම් මිල ඉහළ වටිනාකමක් ඇති වීමත් සිදුවේ. කොළඹ හා මහනුවර විකල්ප අධිවේගි මාර්ගය හා කොළඹ නගරයේ වක්‍රාකාර මහා මාර්ගයේ කටයුතු අවසන් වූ දිනක සංවර්ධනයේ ප්‍රගතිය දැකබලා ගත හැක.

ස.ණ.ස. සාමාජිකත්වයට මාර්ග සංවර්ධනයෙන් බලාපොරොත්තු විය හැක්කේ පොදුවේ ගත් කල, වැයවන කාලය, මානසික ආතතිය අවම වීම, පෙර වැය වූ මුදල් ප්‍රමාණයට වඩා අඩු මුදලකින් සියළු කටයුතු සිදුකර ගැනීමට ඇති අවස්ථාවයි. ස.ණ.ස. බැංකු කටයුතු පුළුල්වීමෙන් හා සාමාජික හිතසුව වර්ධනය වීමෙන් සතුටින් කාලය ගෙවිය හැකි පවුලක් නිර්මාණය වේ.

## ස.ණ.ස. පුවත් කොළඹින්

☆ **අධීක්ෂණය**
ඩී. වීරසූරිය
ලක්ෂ්මන් අමරතුංග

☆ **ප්‍රකාශන කමිටුව**
පියසීලි හේමලතා
හේමසිරි බෙනරගම
එම්.රොහාන් ජේ. පෙරේරා
යු.ඩී.එස්. වීරසිංහ
ලක්ෂ්මන් ගුණවර්ධන

☆ **විධායක සහාය**
නාලක ජයසූරිය

☆ **පරිගණක අක්ෂර හා සැලසුම**
කේ. ඒ. සම්පත් ප්‍රසංග

**කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමය**
**220/1, හයිලෙවල් පාර, මහරගම.**
**දු.ක. 0112 851213, 0112 848801, 0114 301228**
sanasacolombo@gmail.lk

# සැමට සමානතාවය



1911 දී ඇමෙරිකාවේ ඇඟළුම් කර්මාන්තශාලවක සිදුවූ අරගලයක ප්‍රතිඵලයක් ලෙස, ලෝක කාන්තා දින සැමරුමක් ආරම්භ විය. 1964 දී, ටියුලි ද සිල්වා මැතිණියගේ මුලිකත්වයෙන්, ජාතික කාන්තා කමිටුවක් පිහිටවූ අතර, 1979 දී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ, කාන්තා කාර්යාංශයක් පිහිටුවන ලදී.

ලෝකයේ පළමු අගමැතිණිය සහ ජනාධිපතිනිය බිහිවුයේ ශ්‍රී ලංකාවේය. හෙළ බොදු කාන්තාවෝ සමාජ සාරධර්ම ආරක්ෂා කරමින් ගෘහ ආර්ථිකය පෝෂණය කරන්නියද වන්නීය. ශ්‍රී ලංකා ජනගහනයෙන් 52% ක් කාන්තාවන්ය. රැකියා නියුක්තියන් සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේද බහුතරයක් සිටින්නේ කාන්තාවන්ය. පවුල් සංසාථාව පෝෂණය කර, පවත්වාගෙන යාමේ භාරධූර කටයුත්ත පැවරී ඇත්තේ කාන්තාවටය.

විශේෂයෙන් සණස ව්‍යාපාරයද, කාන්තා කමිටු සහ ළමා සමාජ පිහිටුවා කටයුතු කරනු ලබයි. කාන්තා කාර්යාංශය සමිති සමාගම් හරහා ලබාදෙන ශිල්පීය දැනුම අගය කළ යුතුයි.

කාන්තා අයිතිය සුරක්ෂිත කිරීම අපසතු වගකීමකි. ජාත්‍යන්තර කාන්තා දිනයේ තේමාව වන්නේ සැමටම සමානාත්වයයි.

**ප්‍රේමලතා වනිගසේකර - හෝමාගම කලාපයේ අධ්‍යක්ෂිකා කාන්තා කමිටු ලේකම්**

# 2020 වර්ෂයේ දෙහිවල ගල්කිස්ස කලාපයේ

## නව නිලධාරි මණ්ඩලය

| | | |
|---|---|---|
| **ගරු අධ්‍යක්ෂක** | : | මධුවන්ත පෙරේරා මයා |
| **ගරු කලාප සභාපති** | : | ගාමිණි ආර් රාජපක්ෂ මයා |
| **ගරු උපකලාප සභාපති** | : | ප්‍රසාද් විජේවර්ධන මයා |

**දෙහිවල පර්ෂදය**
ගරු පර්ෂද සභාපති : එච්.පී. කල්දේරා මයා
ගරු උප සභාපති : තිලක චන්ද්‍රපෙරේරා මයා
ගරු පර්ෂද ලේකම් : ජයන්ති වැලිකඩ මිය

**ගල්කිස්ස පර්ෂදය**
ගරු පර්ෂද සභාපති : චිත්‍රා පෙරේරා මිය
ගරු පර්ෂද උපසභාපති : ඩී.ඒ. චන්ද්‍රපාල මයා
ගරු පර්ෂද ලේකම් : චාන්දනි විජේසේකර මිය

පසුගිය වර්ෂයේ හිටපු නිළධාරි මණ්ඩලය එකමුතුවෙන් වැඩ කටයුතු කල බව සදහන් කරමු. කාර්‍යඵල ඇගයීමේ උළෙලේදී අප කලාපයේ කරගම්පිටිය සණස සමිතිය වැඩිම ලකුණු ලබාගෙන ඒ කාණ්ඩයේ ප්‍රථම ස්ථානයට පැමිණිම ඉතාම සතුටට කරුණක් බව සිහිපත් කරමු. එසේම බී. කණ්ඩයේ ඉහලම ලකුණු නැදිමාල සණසටත්, උද්‍යාන සණසටත් හිමිවිය. ටෙම්ප්ලර් පාර සණස, නැ.කව්ඩාන සණස , සරණංකර සණස, සී කාණ්ඩයට පත්වුයේ බී කාණ්ඩයේ ආසන්නයේම ලකුණු ලබා ගැනීමෙන්ය. මෙවර එම අඩුපාඩු සම්පූර්ණ කරගෙන ජයග්‍රහනය කිරීම එකම බලාපොරොත්තුව බව සදහන් කරමු. අක්‍රීය සමිති නගා සිටුවීමටත් 2020 වර්ෂය තුල සියලුම සමිති නව මගකට ගෙන ඒම එකම අධිෂ්ඨානය බවත් පවසන්නෙමු.

**චාන්දනි විජේසේකර**
**ගල්කිස්ස පර්ෂද ලේකම්**

# පහත්ගම සමිතියේ වාර්ෂික වන්දනා චාරිකාව



පහත්ගම සණස සමිතියේ වාර්ෂිකව පවත්වාගෙන යනු ලබන වන්දනා චාරිකාව මෙවර අනුරාධපුර ථූපාරාම චෛත්‍යය රාජයානන් වහන්සේ මුල්කර වාර්ෂිකව පවත්වන කප්රුක් පූජාව ථූපාරාම චෛත්‍ය වෙත සිදු කරන ලදී. ඒ සදහා සාමාජික සාමාජිකාවන් සියයකට අධික පිරිසක් සහභාගී වූහ.

ථූපාරාම කප්රුක් පූජාව අවසානයේ ශ්‍රී මහා බෝධිය සහ රුවන්වැලි මහසෑය වන්දනා කිරීමෙන් අනතුරුව වන්දනා චාරිකාව අවසන් කරන ලදී.

**කේ.ඒ. පියතිලක - ගරු සභාපති පහත්ගම සණස**

# ස.ණ.ස.
පුවත් කොළඹින්




## හැත්තෑ හයට අපි ආවා

සී.ස. එගොඩඋයන සණස සමිතියේ 76 වෙනි සංවත්සර උත්සවය ස.ණ.ස. මන්දිරයේදී පසුගියදා පවත්වන ලදී. මේ ඒ සදහා පිදෙන උපහාරයයි.

| | |
|---|---|
| බෝධිරාජ පින්භූමියෙ ඇරඹුවා අපේ | ස.ණ.ස. |
| වැලි මළුවේ පැදුරෙ ඉදන් ගණුදෙනු කල අපේ | ස.ණ.ස. |
| ඤාණාලෝක හිමිපාණෝ පෙරමුණගත් අපේ | ස.ණ.ස. |
| ඤාණවිමල හිමිගෙ බලෙන්, දියුණුවටම යනව | ස.ණ.ස. |
| | |
| දෙමහල් මැදුරක් ඇතුලත අපෙ සමිතිය පිහිටා | ඇතේ |
| සුපිරි පහසුකමින් යුතුව බැංකුවක්ද අප | සතුවේ |
| රනින් රිදීයෙන් නිමකල සම්මානද අපට | ඇතේ |
| ගණුදෙනුවද හරි පහසුයි ලොකු මුදලක් ඉතිරි | වෙතේ |
| | |
| එස්.පහ ක්‍රමටයයි වැඩ හිමිගෙ අණට | ගරුකරනව |
| මැනේජර්ගෙ දක්‍ෂකමට සේවකයින් | නැඹුරුවෙනව |
| සියළුදෙනා එකමුතුවී ලස්සන ස.ණ.සක් | හදනව |
| වසරක් වසරක් පුරාම අපෙ සමිතිය කප් | ගහනව |
| | |
| සුපිරිම තෙමහල් මැදුරෙන් මාසික කුලියක් | ලැබෙනව |
| මුළු ගමටම පාන් බෙදන බේකරියෙන් මුදල් | එනව |
| කඩකාමර කුලියට දී මාසෙට ගාණකුත් | එනව |
| ගමන් බිමන් පහසු කරන රෝද තුනේ රථ | තියනව |
| | |
| සෑම වසරකම එක්දින ශීල ව්‍යාපාරෙ | ඇතේ |
| ලේ දන්දීමේ පිංකම හරි සරුවට කෙරෙනු | ඇතේ |
| සහනදායී මුදලක් ගෙන ඇස් කණ්නාඩිද | සැපයේ |
| පොසොන් පොහොය නිමිති කරන් මහා දන්සැලකුත් | පැවතේ |
| | |
| පාසැල් යන දරුවන්හට පොත්පත් සැපයීම | කරයි |
| ලෙඩට දුකට සැප සතුටට සුභසාධකෙ පෙරටම | එයි |
| නැටුම් ගැයුම් කලා උළෙල හරි ඉහලින් | පැවතෙනවයි |
| වසරට දින තුනක් පුරා චාරිකාව | විනෝදටයි |
| | |
| වසර තිස්හතක් පුරාම මා සමිතිය වෙත | එනවා |
| මුල් පුටුවේ දක්‍ෂකමින් අපි දියුණුව වෙත | යනවා |
| ත්‍රිවිධ රත්නයේ පිහිටයි සියළු දෙවිගෙ | රැකවරණයි |
| මතු දිනයෙදි මගේ ස.ණ.ස. ලක්බිම ජය කෙහෙළි | නඟයි |

**ටෙස්ලි බැසිල්ඩා ගුණවර්ධන - එගොඩඋයන සණස සමිතිය**

## දානමය පිංකම

සී.ස. ගලවිලවත්ත උතුර සණස සමිතිය මගින්, පැවැත්වූ දානමය පිංකම, ගලවිලවත්ත විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ විහාරාධිපති ඇහැළියගොඩ පුණ්ණජී ස්වාමින්වහන්සේගේ ප්‍රමුඛත්වයෙන්, නිලධාරී මණ්ඩලයෙත්, සාමාජික සාමාජිකාවන්ගේ දායකත්වයෙන්, මෙම උතුම් පිංකම සිදුකල අතර, මියගිය සාමාජික සාමාජිකාවන්ටත්, ජීවත්වන සියලු දෙනාටම, ආශිර්වාද පිණිස සිදුකරන ලදී.

**ප්‍රේමලතා වණිගසේකර - කාන්තා කමිටු සභාපතිනී**





## 78 වන වසරට පා තබන වේරගල මාහිංගල සණස සමිතිය

සී.ස. වේරගල මාහිංගල සණස සමිතියේ 78 වන සංවත්සරය පසුගියදා වේරගල ප්‍රජා ශාලාවේදී පැවැත්විය. නව නිලධාරීන් පත් කිරීමෙන් පසු අප සමිතියේ කළමණාකාර ඉනෝකා මහත්මිය විසින් ආදායම් ප්‍රකාශනය හා මුල්‍යමය තත්වය සමිතියට ඉදිරිපත් කරන ලදී. ශිෂ්‍යත්වය සමත් දරුවන්ට මෙන්ම වර්ෂයේ පැමිණීම අනුව සාමාජිකයන්ට තෑගි ප්‍රදානයද සිදුවිය. මේ සියලු දෑ සමිතියේ සාමාජක අපට ලැබුනේ යහපත් ස්වෙච්ඡා නිලධාරී පිරිසකගේ කැපවීමෙනි. අප සණස සමිතිය දිනෙන් දින දියුණුවේවා යැයි සාමාජික ප්‍රාර්ථනයයි.

**පී.කේ. ඉන්ද්‍රානි**
**වේරගල මාහිංගල සණස**

## 2020 නව වසරේ නුගේගොඩ කලාපීය කාන්තා කමිටු රැස්වීම.

නුගේගොඩ කලාප කාන්තා කමිටුව නාවල කොස්වත්ත සණස ශ්‍රවණාගාරයේදී පසුගියදා පවත්වන ලදී.

නව වසරේ මුල්ම කාන්තා කමිටු රැස්වීම සදහා ඉතා හොඳ සහභාගීත්වයක් දක්නට ලැබිණි. ගරු කලාප අධ්‍යක්‍ෂතුමා වන එච්.කේ.ඩබ්. ඩයස් මහතාගේ ප්‍රධානත්වයෙන් කටයුතු ආරම්භ කෙරුණි. කලාප සභාපති උප සභාපති ධුරය ජයන්ති රණසිංහ මහත්මියද ශාන්ත මල්ලව ආරච්චි මහතාද සභාව දැනුවත් කරමින් දේශනයන් කරන ලදී.

කලාප කාන්තා කමිටු සම්බන්ධීකරණ නිලධාරිනිය වන රෝහිණී ඩයස් මහත්මිය, කලාප කාන්තා කමිටුව සහ එහි මූලික අරමුණු පිළිබදව කමිටු සාමාජිකාවන් ට අවබෝධයක් ලබා දුනි. සමුපකාර ව්‍යාපාරය තුල රැදී සිටීමේ වැදගත්කම හා ස්වෙච්ඡා නායකත්වයේ වැදගත්කම පිළිබදව ද සාකච්ඡා කරන ලදී.

කලාප අධ්‍යක්‍ෂක කමල් ඩයස් මහතා විසින් ළමා සමාජ වල උන්නතිය උදෙසා ක්‍රියා කල යුතු ආකාරයත් දැනුම ආකල්ප සහ කුසලතා වලින් හෙබි දෙවෙනි නායකත්වයක් සදහා සුදුසු ළමා සාමාජිකයින් බිහි කරගත යුතු බවත් පැහැදිලි කරන ලදී.

දිස්ත්‍රික් සංගමය මෙම කටයුතු සදහා දායක වන ආකාරයත් දැනට ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් පිළිබදවත් රෝහිණී ඩයස් මහත්මිය වැඩිදුරටත් සභාව දැනුවත් කලාය.

### නුගේගොඩ කලාපීය කාන්තා කමිටුව

| | | |
|---|---|---|
| **සභාපතිනිය** | : | සේපාලි ජයරත්න මහත්මිය |
| **උප සභාපතිනිය** | : | එම්. මෙලනි ප්‍රනාන්දු මහත්මිය |
| **ලේකම්තුමිය** | : | චන්ද්‍රමාලි කල්දේරා මහත්මිය |

**රාජගිරිය පර්ෂදය**

| | | |
|---|---|---|
| **සභාපතිනිය** | : | රේණුකා දමයන්ති මිය |
| **උප සභාපතිනිය** | : | එන්.එච්. සෝමාවතී මිය |

**ශ්‍රී ජයවර්ධනපුර නුගේගොඩ පර්ෂදය**

| | | |
|---|---|---|
| **සභාපතිනිය** | : | සාමා සිරියාවතී මිය |
| **උප සභාපතිනිය** | : | එම්.කේ. චිත්‍රානි පෙරේරා මිය |

**රෝහිණී ඩයස් අබේසිංහ**

## ලෝක ජල දිනය

### මාර්තු 22



මේ දිනවල පවතින වියළි කාලගුණය පොදුවේ මිනිසා වන අපට දැනෙන්නේ ඉතාම කර්කශ ලෙසටයි. නිවසේ ඇති කරන සුරතල් සතුන් දවස පුරා පොළවේ වැතිර සිටින්නේ මෙම අපහසුතාවයන්ගෙන් මිදීමටයි. කුඩා දරුවනට නිරාවරණය වූ හිරු එළියේ ක්‍රීඩා කරන්නට කාලසීමාවන් තීරණය කර තිබෙන්නේත් අධික උෂ්ණත්වය නිසාමය. ඒ නිසාම විජලනය වැනි තත්වයන්ද ඇතිවීමටත් බොහෝ දුරට ඉඩ කඩ තිබේ. මේ දිනවල දිවාකල උෂ්ණත්වය සෙල්සියස් අංශක 34ක් පමන වනවා. මිනිසෙකුට දිනකට වතුර වීදුරු 6ක් වත් බොන්නට අවශ්‍ය බව කියවෙනවා. එහෙත් මේ දිනවල එයට වඩා පානය කරන්නට සිදුවන බව අප දන්නවා. අප සෞරග්‍රහ මණ්ඩලයේ විසිතුරුම නිල්වන් ග්‍රහලෝකය වන්නේ පෘථිවියයි. එයට හේතුව වන්නේ පොලෝ තලයෙන් 70%ක් පමන ජලයෙන් වැසී තිබීමයි. එම ජලයෙන්ද 97.2% පමන ඇත්තේ කරදියය.

පොලෝ තලයෙන් හා ජල තලාවලින් සිදුවන වාෂ්පීකරන ක්‍රියාවලිය මගින් වාතයට ජලය මුදාහැරේ. වාෂ්ප ලෙස පවතින එම ජලය වැස්ස, හිම, පිනි, මීදුම්, තුෂාර වැනි නම් වලින් අපේ ලෝකයට එක්වෙයි. මෙය ජලචක්‍ර යයි. දැනට සොයාගෙන ඇති ජලය පවතින එකම ග්‍රහ ලොව වන්නේ පෘථිවියයි. එහෙත් මේ සීමිතවූ ජලයෙන් අප උපරිම ප්‍රයෝජන ගන්නවාද? අප වැඩි වශයෙන් ජලය නාස්ති කරන බව සැබෑවකි. ජලයේ වටිනාකම ඔබ නිසැකවම දන්නවා නම් කනගාටුවිය යුතුයි. ලංකාවේ ප්‍රධාන ගංගා 43ක් ඇත. ඒ මගින් මිනිසාගේ අවශ්‍යතාවයන් මෙන්ම පාරිසරික අවශ්‍යතාවයන්ද සපුරාලනු ලබනවා. ඉදිරිදිනකදී රන් බිංදුවකට වඩා ජල බිදුවක වටිනාකම වැඩිවන බව නම් පැහැදිලියි. එදිනට ගංගානම් ගගේ ජල ආරාවුල වැනි දේ අප රටේත් ඇතිවීමට ඉඩ තිබේ.

පරිසර විනාශයන් නිසා කාලගුණ රටාවන් විපර්යාසයන් බවට පත්වී තිබෙනවා. ඒ අතරේ ජල පාරිභෝජනය ඉහල යමින් තිබෙනවා. වන විනාශය නිසා ජල සම්පත සිදී යනවා. 'මරණාසන්න මොහොතකදීවත් දිවගාන්නට ජල බිඳක් ඉතිරි කරමු.'

**ලක්ෂ්මන් ගුණවර්ධන**

# විප්ලවීය කාන්තා දින අරගලය

## සමාජගත ලිය සළකුණ



එක්සත් ජාතීන් විසින් පිළිගෙන.
ජාත්‍යන්තර කාන්තා දිනය
සැමරෙන මාර්තු 08 වෙනිදා
වෙනුවෙන් කාන්තා සළකුණ

කරුණා, දයා, සෙනෙහස පිරිපහදු වෙමින්
සැළසුම් ඉලක්කය අභියෝගයක් වෙමින්
ළදැරිය ළමාවිය ගෙවමින් සතුටු වෙමින්
මල්වර වුනා බොදු සඟියට එළිය වෙමින්

පිය සෙනෙහසේ ගැටවර විය අත්වින්ද
රහමෙර සුවඳ තැවරී නැත සිරුරෙන්ද
සිනහව අභිබවා ලෙන්ගතු කමකින්ද
සැමියා පා නැමද නින්දට සැරසෙන්ද

හෙළයේ සිරිත් - විරිතට නැකතින් බෝවා
කුළඟන අපිස් දිවියක සුවයෙන් බෝවා
ජීවන රටා රිද්මය රකිමින් බෝවා
දැහැමින් පරපුරේ හැම දරුවන් බෝවා

ගැහැණිය උරුමකරගත් ජීවිතය පුරා
වර්ගය බෝකලේ වගවීමක්ය දරා
මෑණිය සුවදවත් චරිතය දෙරණ අරා
පිළිමය නොවේ, නීතියෙ දෙවඟනය නරා

පොපියන දෙතොල් අතරේ රැදි කිරි අම්මා
කකියන හදවතේ පතුලේ රැදි දුක් අම්මා
සුරකින ජීවිතේ පොත් පිටු කිව් අම්මා
නොමියන භාවිතේ සළකුණ පිං පොත් අම්මා


සිලි සිලි සරින් මද සුළඟින් රඟදෙන බෝපත්
සදුන්, සුවද සරමින් සිත් සනහන බෝපත්
මලින් පිදුව බුදුරුව දුන් හිනැහෙන බෝපත්
කිරෙන් මිදුන අම්මා පැන් ඉහගෙන වියපත්

පබඳුම - හේමසිරි බෙනරගම

සෑම වසරකම මාර්තු මස 8 වන දිනය, අන්තර්ජාතික කාන්තා දිනය ලෙස ලොව පුරා සමරනු ලබයි. කෝටි සංඛ්‍යාත කාන්තාවෝ පොළපාලි, උත්සව සහ රැස්වීම් මේ වෙනුවෙන් පවත්වති. සණස කොළඹ දිස්ත්‍රික් සංගමයද සිය ශාඛා සමිති සමග මෙම දිනය උත්කර්ශවත් ලෙස පවත්වනු ලැබේ.

ඇමරිකාවේ නිව්යෝර්ක් නගරයේ 1857 මාර්තු 8 වන දින සිදුවුයේ අපූරු සිදුවීමකි. නගරයේ වීදි පුරා, වැරහැලි ඇදුමින් සැරසුනු කාන්තාවෝ පෙළපාලි පැවැත්වූහ. මොවුන් අත තිබූ සටන් පාඨ බැනර්වල ප්‍රධාන ඉල්ලීම් 2 ක් විය. සේවයට සරිලන වැටුප හා දෛනිකව පැය 15, 16 සේවා මුරය වෙනුවට පැය 10ක සේවා මුරයක් ලබාදෙන ලෙසයි. අරගල කල කාන්තාවන් පොලිසිය විසින් අත් අඩංගුවට ගන්නා ලදී. මේ වන විට පුරුෂ පක්ෂයේ වෘත්තිය සමිති බලවත් නොවීය. කාන්තා සමිති වර්ෂ 3 කට පසු තමන්ගේම වෘත්තීය සමිතියක් පිහිටුවාගෙන කම්කරුවන්ගේ ජාතික සංගමයට ඒකාබද්ධ කරන ලදී.

නැපෝලියන් අධිරාජයාගේ අවධියේ කම්කරු සංවිධාන දුර්වල විය. 1844 ජ්ලෝරා ක්‍රිස්ටන් නමැති වීර කාන්තාව කාන්තා ඉල්ලීම් ඇතුලත් 'කාන්තා සමිතිවලට සැලැස්මක්' යනුවෙන් ග්‍රන්ථයක්




පලකරන ලදී. සාමාන්‍ය කාන්තාව සහ වැඩකරන කාන්තාව, දෙදෙනාගේම විමුක්තිය එකම බව පෙන්වා දෙන ලදී. 1849 ජින් මෙරොයින් නමැති කාන්තාව නීති සම්පාදිකාවක ලෙස සේවය කරමින් 1851 දි ආණ්ඩුක්‍රම පනත වෙනස්කිරීමට සහභාගි විය. මේ නිසා ඇයට මාස හයක සිර දඩුවමක් විදින්න සිදුවිය. මේ කාලයේදි එංගලන්තයේ කාන්තා ව්‍යාපරවල පිබිදීමක් සිදුවිය.

එහි පුරෝගාමි වුයේ කැරොලින් නෝටින් ඉංග්‍රීසි නීතියට විරුද්ධව සටන් කලාය. කාන්තා අයිතිවාසිකම් සහ දරුවන්ගේ උරුමයද බ්‍රිතාන්‍ය විසින් නොසලකා හරින ලදී. කර්මාන්ත ශාලා හිමියෝ කාන්තා ශ්‍රමය සුරා කෑහ. නැතිවී ගිය අයිතිවාසිකම් වෙනුවෙන් සටන් වැදීමට කාන්තාවට සිදුවිය. මේ අතර ඇතැම් මාධ්‍ය කාන්තා සටහන් ව්‍යාපාරය නිර්දය ලෙස විවේචනය කරන ලදී.

1865 දී ඇමරිකාවේ එළිසබෙත් මිලර්, ලුසී සිටෝන් සහ සුසාන් ඇන්තනි අයිතිවාසිකම් සටනේ පෙරමුණ ගත්හ. කාන්තා ඡන්ද බලය උදෙසා 'බ්ලු මර්ස්' නමින් කාන්තා ඇදුමකින් සැරසී උද්ඝෝෂණ වලට සහභාගි වූහ. ඇමරිකානු කාන්තා සම්මේලනවලට සහභාගි වී සටහන් මෙහෙයවනු ලැබීය. 1776 දී ප්‍රකාශයට පත්කල නිදහස් ඡන්ද අයිතිය ඉල්ලා සටන් කළෝය. සංවත්සරයට වසර 12 කට පසු එනම් 1869 දී ඇමරිකාවේ වියොමින් ප්‍රාන්තයේ කාන්තාවන්ට ඡන්ද බලය ලබාදෙන ලදී. මෙය ප්‍රථම ජයග්‍රහණය වු අතර පසුව අනෙක් ප්‍රාන්තද ඡන්ද අයිතිය දිනාගන්නා ලදී.

ලන්ඩන් නුවර ස්ටුවට් මිල් මන්ත්‍රීවරයා කාන්තා ඡන්ද බලය පිළිබද ප්‍රථම දේශනය සිදුකලේය. 1869 නාගරික ඡන්ද බලය කාන්තාවට හිමිවිය. වහල්බැමි දෙදරායාමකි. ප්‍රංශයේ පැවැති යුද්ධයේදි පැරිස් ජනතාවට වෙඩි තැබීමට 1871 දී කල නියෝගයට කාන්තාවෝ එකහෙලා විරුද්ධ විය. මේ නිසා යුද හටයෝ ජනතාවට වෙඩි තැබීම ප්‍රතික්ෂේප කළහ. කාන්තාවන් දස දහසක් පමණ පිරිමින් හා කරට කර සටන් වැදුනි. තුන්වෙනි සමුහාණ්ඩුව සමග මාරියා ඩොරේස් කාන්තා අයිතිවාසිකම් පිළිබඳ සංගමයක් ආරම්භ කළාය.

කාන්තාවන්ගේ අධ්‍යාපනය ගැන උනන්දු වු පිරිස එංගලන්තය ජර්මනිය සහ ප්‍රංශයේ විශ්ව විද්‍යාවලට බලෙන් ඇතුලු වී උපාධි ලබාගත්හ. සාධාරන හා සාමකාමී සමාජයක් උදෙසා සටන් කලහ. රෝසා, ලක්ෂන්බර්ග් සහ ක්ලෝරා සෙටනික් වීර කාන්තාවන් බවට පත්විය. 1899 දී හේග් නුවර යුද්ධයට විරුද්ධව සම්මේලනයක් පැවැත්වීය. 1910 පැවැත්වු කාන්තා සම්මේලනයේදී මාර්තු 8 ප්‍රථම කාන්තා සටන් දිනය වශයෙන් පිළිගන්නා ලදී.

සාර් පාලනයට යටත්වු රුසියානු කාන්තාවෝ යුද්ධය හංගවේවා යි. 1913 මාර්තු 8 වීදි දිගේ පෙළපාලි ගියහ. පළමු ලෝක යුද්ධයෙන් පසු, සමාජවාදි ව්‍යාපාර දියණු විය.

හිට්ලර් බලයට පත්වීමෙන් පසු ජනතා ව්‍යාපාර සහ කාන්තා අයිතීන් බිද වැටුණි. 1936 මාර්තු ස්පාඤ්ඤ කාන්තාවෝ පනස් දහසක් පමණ පැසිස්ට් වාදයට විරුද්ධව පෙළපාලි පැවැත්වූහ. හිට්ලර්ගේ පැසිස්ට්වාදි ක්‍රියාකාරකම් වලින් කෝටිගණනක් ජනතාව මියගියහ. ජීවිත පරිත්‍යාගයෙන් කල කාන්තා සටන් නිසා 1945.12.01 කාන්තාවන්ගේ අන්තර්ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සම්මේලනය බිහිවිය. පරමාණු අවි යොදා ඇමරිකාව, වියට්නාමයේ සිදුකල මිනිස් සංහාරවලට විරුද්ධව උද්ඝෝෂණ කලහ. මේ අනුව විරෝධතා සටන්වලින් තොරව ජයග්‍රහනයක් ලබාගත නොහැකි බවට වීර කාන්තා පරපුර ඔප්පුකලහ.

**යු.ඩී.එස්. වීරසිංහ**
**නැ.ඇරැව්වල අංක 2 සණස**

## සී.ස. මාලපල්ල මාකුඹුර සණස



## 65 වන සංවත්සරය

සීමාසහිත මාලපල්ල මාකුඹුර සණස සමිතිය 65 වන සංවත්සර මහ සභාව පසුගියදා සමිති ශාලාවේදී ගරු සභාපතිනී කල්‍යාණි වික්‍රමතුංග මහත්මියගේ මුලිකත්වයෙන් පවත්වනු ලැබීය. සංවත්සර මහ සභාවේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස කොළඹ දිස්ත්‍රික් සංගමයේ සාමාන්‍යාධිකාරිතුමන් වන ලක්ෂ්මන් අමරතුංග මහතාද සෙසු ආරාධිත අමුත්තන් ලෙස කොට්ටාව උතුර සණස සමිතියේ ගරු සභාපති රංජිත් ජයතිලක මහතා, කුලසෙවණ සණස සභාපතිනී බී. බටගොඩ මහත්මිය, කොළඹ දිස්ත්‍රික් සංගමයේ නිලධාරිනී පර්ෂද සම්බන්ධිකරණ ලේකම් නිලන්ති සුදසිංහ මහත්මිය යන අයද සහභාගී වූහ.


මෙම සංවත්සර මහ සභාව දිරිය ළමා සමාජයේ දැරියකගේ නර්තනයකින්ද හැඩ වු අතර අප සමිතියේ ජ්‍යෙෂ්ඨ සාමාජික මහත්ම මහත්මීන් ඇගයීමක් ද සිදුකරනු ලැබීය. එසේම වැඩිම කොටස්, අනිවාර්ය, තැන්පත්, වාර්ෂික පැමිණීම වැනි විවිධ අංශ සදහා ද ත්‍යාග පිරිනැමීමද සිදුවිය.

**මෙහිදී 2020 වර්ෂයේ කාරක සභිකධුර සඳහා නව නිලධාරී මඩුල්ල ලෙස පහත සදහන් මහත්ම මහත්මීහු පත්වූහ.**

| | | |
|---|---|---|
| **ගරු සභාපති** | : | ආර්. කස්තුරිආරච්චි |
| **ගරු උපසභාපති** | : | පී. කල්‍යානි ද සිල්වා |
| **ගරු භාණ්ඩාගාරික** | : | ආර්. විරාජ් මධුසංඛ |
| **ගරු කාරකසභික** | : | ඩී.ආර්. චන්ද්‍රසිරි, ජේ. චන්ද්‍රකාන්ති, පී.ඒ. ලලිත් ලංකික, ඉසුරු මධුෂාන්, අචලා චිත්‍රාංගනී, රෝහිණී වන්නිආරච්චි |

**ආර්. කස්තුරිආරච්චි - සභාපති**

## සමාජවිද්‍යාපති උපාධි ලබති



කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පසුගියදා පවත්වන ලද කොළඹ විශ්වවිද්‍යාලයීය උපාධි ප්‍රදානෝත්සවයේදී සීමාරහිත අම්බලන්ගොඩ ස.ණ.ස. සමිතියේ ගරු සභාපති ඩබ්. නිමල් රත්නපාල ද සිල්වා මහතා සමාජවිද්‍යාපති උපාධිය ලබාගන්නා ලදී. ඔහු මෙයට පෙර ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද කැළණිය විශ්වවිද්‍යාලයෙන් වාග් විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා ගෙන ඇති අතර මෙවර ලබා ගන්නා ලද පශ්චාත් උපාධියේ විශේෂත්වය වන්නේ ඒ වෙනුවෙන් ඔහු විසින් කොළඹ විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකා කිහිපයක් හා අවසන් නිබන්ධනයද ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය හා සණස ව්‍යාපාරය සම්බන්ධයෙන් සිදු කිරීමයි. ඒ මහතාගේ සමුපකාර කටයුතු මෙන්ම අධ්‍යාපන කටයුතු සාර්ථක වේවායි සුභ පැතුම් එකතු කරමු.

**එම්. රොහාන් ජේ. පෙරේරා**

## 25 වන සංවත්සර උත්සව සැමරුම

| | |
|---|---|
| ගොඩලන පිණිස සතගත වන සතර | අපා |
| අනුශාසනා අප වෙත කුළුණු | පපා |
| වරදක් දුටුවොත් නිවැරදි ලෙස යෙදෙන | උපා |
| කස්සප නා හිමි අපේ පළමුව වදිමු | දෙපා |
| අපි හැම හමු උනෙමු එකමුතු කමින් | සිට |
| සැමරුම උත්සවයේ කටයුතු කිරීම | ට |
| ඉටුවී සියලු දෙය සැකසුම ලබන | විට |
| සුරිඳුනි කතරගම පිහිටය දෙවනු | වට |
| සාමාජික පිරිස පසුවෙන අසුන් | ගෙන |
| ස.ණ.සට මැණික් කැට මෙන් දිස්නයෙකි | දෙන |
| සහයෝගයෙන් මතු දියුණුව ලබන | දින |
| අපි යමු ඉදිරියට බාධක ඉවස | ගෙන |
| කිරි බදුනකට එක්කල විට රසැති | පැණි |
| එක්වෙයි කුහුඹුවන් මෙහි ඇති මිහිර | දැනී |
| දියුණුව සතුට සහනය හදවතට | පෙනී |
| සැමදෙන රැදෙනු ඇත බලවත් සතුට | කිනී |
| නිබදව සිහිකරමි නිල මණ්ඩලය | ගැන |
| අගයමි ඔබේ සේවය අගය | මින |
| මහතා නිමල් කල සේවය අගය | මින |
| උපහාරය පුදමු සැකසුම සුවය | දෙන |
| පළමුව වසර විසිපහ සැමරුම් | උළෙල |
| ඉමහත් සතුට බිහි වේයි අප හද | පතුල |
| ගෙන යන්නට දිවිය සිත නොමවෙයි | සසල |
| පිහිටට ස.ණ.ස. සැමදා ඇත අප | අසල |

**විමලා බණ්ඩාර - ගලවිලවත්ත මාලපල්ල සණස**

## සාතිශය සංවේගය

අප අතරින් හදිසියේ වියෝ වූ
සීමාසහිත කොට්ටාව උතුර සණස
සමිතියේ කළමණාකරු

**වසන්ති විතානගේ මහත්මියට**
**නිවන් සුව ප්‍රර්ථනා කරමු.**



**සීමාසහිත කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ**
**ගරු සභාපතිතුමා ප්‍රධාන අධ්‍යක්ෂක මණ්ඩලය හා කාර්ය මණ්ඩලය**



**ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරිවරයෙකු**
**මෙන්ම**
**භාණ්ඩාගාරයේ මුදල් අධ්‍යක්ෂවරයකු වූ**

## සංගමයේ සභාපතිගෙන්

ප්‍රශ්න විමසා පිලිතුරු ලබා ගන්න.

**ප්‍රශ්ණය** : තීරකකරණයකින් පසුව මුදල් ගෙවන ලද අයෙකු කාරක සභාවට පත් කළ හැකි ද?

**පිළිතුර** : රීති 21 හි සදහන් වන පරිදි කාරක සභාවට පත්වීමට නොහැකි එක් කාරණයක් වන්නේ තමන් විසින් ගෙවීමට ඇති මුදලක් යම් සමුපකාර සමිතියකට ගෙවීම මාස 3 කට වඩා කල් පසු කර තිබීමය. යම් සාමාජිකයකු කාරක සභාවට තෝරා පත්කරන්නා අවස්ථාවේ දී ණය මුදලක් හෝ පොලී මුදලක් හෝ සමිතියට ගෙවිය යුතු වෙනත් යම් මුදලක් ගෙවීම මාස 3කට වඩා කල් පසු කර ඇත්නම් ඔහු පත් කිරීම නීතියට පටහැනි වේ. තීරකයකට යොමු කිරීමෙන් පසුව ලැබෙන නියමය අනුව මුදල් ගෙවා ඇති විටෙක ඔහු කාරක සභාවට තෝරා පත්කර ගැනීමට නීතිමය බාධාවක් නැත. එහෙත් සදාචාරමය වශයෙන් යෝග්‍ය වන්නේ නැත. විශේෂයෙන් ණයගනුදෙනු සමුපකාර සමිතියක ලබා ගත් ණය මුදලක් නිසි පරිදි ගෙවීම ආදර්ශමත් නායකයෙකුගෙන් බලාපොරොත්තුවේ. ගෙවීම් පැහැර හැර ඇති අය නායකයින් වශයෙන් සිටින විට සාමාජිකයින් තුළ ඇතිවන්නේ කුමන අදහසක් දැයි සිතා බැලිය යුතුය. සමිතියට වටිනාකම් ලැබෙන්නේ ද නැද්ද යන්න වැදගත් වේ.

**ප්‍රශ්ණය** : මහා සභාවක දී තනතුරුවලට නම් යෝජනා කිරීම එක් අයකු විසින්ම කිරීම සුදුසු ද?

**පිළිතුර** : සාමාජිකයකු ලෙසට එසේ යෝජනා කිරීමට නීතිමය අවහිරයක් නැත. එහෙත් එය දකින සාමාජිකයින්ට ඇති වන්නේ ප්‍රසාදයක් ද යන්න සිතා බැලිය යුතුය. මහා සභාවට එවැනි නම් ඉදිරිපත් කරන විට වෙනත් නම් ඉදිරිපත් කිරීමට ද ඉඩ තිබේ. විශේෂයෙන් නම් යෝජනා කිරීමේ දී කාර්යාලයේ සේවයකරන්නන්ගේ දෙමාපියන් විසින්, අඹු සැමියන් විසින් හෝ , කාරක සභිකයින්ගේ පවුලේ අය විසින් හෝ ඔවුන්ගේ නම් යෝජනා කරන්නේ නම් නීතියේ බාධාවක් නැති වුවත් සාමාජිකයින් තුළ ඇතිවන්නේ ප්‍රසාදයක් නම් විය නොහැකිය. ඒ නිසා මේ පිලිබඳව ඒ ඒ සාමාජිකයින් විසින් සැලකිලිමත් වීම වඩාත් සුදුසු වේ.


කෙසේ වෙතත් මහා සභාව පත් කළ පසුව පළමු කාරක සභා රැස්වීමේ දී පත්වූවන් ධුරවලට සුදුසු ද නැද්ද යන්න පිලිබඳව පරීක්ෂා කර බලා ඒ පිලිබඳව ඊළඟ මහා සභාවේ දී දැන්වීම ඉතාමත් වැදගත් වේ. නුසුදුසු අය සිටීනම් ඒ වෙනුවට වෙනත් අය පත් කර ගත යුතුය.

## මාවල්ගම ස.ණ.ස. සමිතියෙන් සමාජ මෙහෙවරක්


2019 වසරේ පිංකම වෙනුවෙන් ගැබිණි මාතාවන් සදහා අවශ්‍ය, ද්‍රව්‍ය බෙදාදීමක් පසුගියදා සමිති ශ්‍රවණාගාරයේදී, සාමාජික සාමාජිකාවන්ගේ ප්‍රධානත්වයෙන් ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ගේ සුරතින් සිදුකරන ලදී.



**සටහන - එච්.කේ. ඇලපාත**



## වාර්ෂික එක්දින චාරිකාව ගියදා...



සීමාසහිත දියගම සණස සමිතියේ වාර්ෂික එක්දින චාරිකාව පසුගියදා දින රත්නපුරය ප්‍රදේශය ආශ්‍රිතව රත්නපුර සමන් දේවාලය, සංඛපාල රජමහාවිහාරය, උඩවලව ඇත්අතුරු සෙවන, මඩුවන්වෙල වලව්ව හා දෙල්ගමුව රජමහා විහාරය දැකබලා වැදපුදා ගත්හ.

සමිතියේ තෙදින චාරිකාවට සහභාගි නොවූ සාමාජික සාමාජිකාවන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවන් මෙම චාරිකාවට එක්වූහ. ගරු උපසභාපති ජේමසිරි වීරසූරිය මහතා ප්‍රමුඛ කාරක සභික මහත්මීන් විසින් මෙම චාරිකාව සංවිධානය කරනු ලැබීය

**චමිලා ජයතුංග - ලේකම් දියගම සණස**

## නෙක්ඛම්ම පාරමිතාව

කුසල සිත් පෙරදැරිව නික්ම යන මාවතේ
දුබල මිනිසකු හවේ කම් සුවය රැඳිගතේ
ප්‍රබල සිතුවිලි නැගේ සපු පොකුරු දස අතේ
නිමල රහතුන් වැඩිය මග දකිමු පිං සිතේ

කෙලෙස් හා වස්තුවද දෙකක්මය හැරයුතේ
පරතෙරට යනු පිණිස සම්බෝධි අභිමතේ
ගිහි සුවය හැරපියා, සසර කෙලෙසුන් රතේ
විදසුනේ ආලෝක පැතිර ඇත හැම අතේ

නෙක්ඛම්ම පුරන්නේ, පැවිදි කම ලබන්නේ
කාමයන් මුදන්නේ නිදහස්ව සිතන්නේ
සත් මුතුම වැන්නේ, අටලෝ දහම් දන්නේ
කමටහන් දෙන්නේ, යථා ශක්තිය උපදවන්නේ

ලොබ සිතම දවාලා නෙක්ඛම්ම පාරමීයේ
අඟපසඟ ආලයෙන් මිදී උප පාරමීයේ
ජීවිතයෙ ආශාව හැරදැමු පරමත්ථ පාරමීයේ
තුන් අයුරු හැර පැවිද, පුරමු දස පාරමීයේ

සුතසෝම රජු එදා පැසුනු නර කෙස නිසා
රජ මැදුර හැරපියා පැවිදි බව ලත් නිසා
මා, පිය බිසව හා කුමරු, කෙල පිඩුසේ හැරි නිසා
'නිකම් පැරුම්' පරමත්, උවම් දෙයි ඔබ නිසා

-හේමසිරි බෙනරගම-

## අවදානමක් නොවන්නට නම්....

මූල්‍ය විනයක් ඇතිව කටයුතු කිරීමෙන්, ස.ණ.ස. සමිති විසින් බලාපොරොත්තු වන සාමූහික ආර්ථික සහ සාමාජීය දියුණුව ඇතිකර ගත හැකි බව ප්‍රායෝගිකව හදුනාගෙන ඇත. අවදානම කළමනාකරනයට ලක්කිරීම වැදගත් වන්නේ මූල්‍ය ආරක්ෂණ ක්‍රියාවලියක ඇති වැදගත් බව අවබෝධ කර ගැනීමෙනි. ණය කළමනාකරණය තුල පවතින අවදානම අවමකර ගැනීමෙන් ණය කල්පසුවීම පාලනය කෙරේ.

නිත්‍ය වශයෙන්ම කෙනෙකුට ණය මුදලක් දීමේදී අවදානමක් ඇති බව තේරුම් ගත යුතුය. ගමේ සණස බැංකුව මුහුණ දෙන අවදානම් දෙකකි. එය සත්‍ය අවදානම හා විචාරාත්මක අවදානම වශයෙන් දැක්විය හැක. ස්වාභාවික අපදාවන් ඇතිවීමෙන් ඇතිවිය හැකි පාඩු සත්‍ය අවදානම වේ. ගංවතුර, නියඟය, සුලිසුළං හා නායයෑම් ආදිය ස්වාභාවික ආපදා ගනයට වැටේ. එසේම සමාජයේ ඇතිවන දේශපාලන කලකෝලහල, ජාතිවාදී ගැටුම්, හා මංකොල්ලකෑම් සමාජ විපර්යාස සේ දැක්විය හැක.

ආයෝජන ක්‍රියාවලිය විචාරත්මක අවදානම ඇතිවිය හැක. ලාභයක් හෝ නිශ්චිත ආදායමක් නොමැතිව ඇතිවන පාඩුව මේ පෙළට ගැනේ. සාමාජික ආයෝජන තුලින් නිශ්චිත ආදායමක් නොමැති නම්, වක්‍රව අවදානමක් ඇතිවේ. ආයතනයකට විශ්වාසනීයත්වය තහවුරු කර ගැනීම සදහා යොදවන මුදලට ඇති රැකවරණයත්, ආයෝජකයාට අවශ්‍ය අවස්ථාවකදී එම මුදල් ආපසු ලබාදීමට හැකිවීමක් තුල ඇතිවන්නේ විශ්වාසයයි. ණය ගණුදෙනු කර්යයක්ෂමව සිදු කිරීම අත්‍යාවශ්‍යවේ. ණය කල්පසු වීම අඩු මට්ටමකින් පවත්වාගෙන යා යුතුවේ. ස.ණ.ස. සමිති හී අවදානම කළමනාකරණය එහි පාලක මණ්ඩලය විසින්ම ඇතිකර ගත හැක.

එම විධික්‍රමයන් මෙසේ දක්වමු. ණය පොලී ප්‍රතිශතය සාධාරණ මට්ටමක පවත්වාගෙන, තම ප්‍රදේශයේ ක්‍රියාත්මක වන මූල්‍ය ආයතන වලට වඩා අඩු ප්‍රතිශතයකට ණය ලබාදීම. තැන්පත් මුදලින්ම ණය ලබා දෙන බව ණය ලබන්නාට තහවුරු වන සේ ක්‍රියාකිරීම. ප්‍රමාණවත් සංචිත ගොඩනැගීමෙන් ණය දීම සදහා තමන්ගේම සම්පත් යොදා ගැනීම. එසේ සිදු කිරීමෙන් ණය කල්පසු කිරීම අවම මට්ටමක රදවා ගත හැක්කේ, සාමාජිකයාට වන පාඩුව ඔවුන් තේරුම් ගැනීමෙනි.

ණය මුදලක් ලබා දීමෙන් පසු පාලක මණ්ඩලයට වගකීමක් පැවරේ. ඔවුන් විසින් නිසි ක්‍රියාමාර්ග ගැනීමට කල්වේලා ඇතිව ණය අතපසු වීම් ගැන අවධාරණයෙන් සිට විධිවිධාන යොදා ගත යුතුය. එම ක්‍රියාවලිය තුල මුදල් අවභාවිතය, මුදල් වංචාව, සිදුනොවීමට අභ්‍යන්තර මූල්‍ය පාලනයක් ඇතිකර ගත යුතුය. මුදල් ගණුදෙනු කරන සාමාජික හා සාමාජික නොවන්නන් සදහා ද්විත්ව වගකීම් ක්‍රමයක් ඇතිකිරීම. සෑම මසක් අවසන මුදල් වාර්තාව අධ්‍යයනය කිරීම. එසේම අභ්‍යන්තර විගණනය මගින් සම්පත් ආරක්ෂා කර ගැනීම ඇතිකර ගත යුතුය.

අවදානම් කළමනාකරණයෙහි ප්‍රධාන කරුණු හතරක් වේ. අවදානම කුමක්ද යන්න හදුනාගැනීම, ප්‍රමාණය පිළිබඳ නිගමනයකට පැමිණීම සිදුවන අවදානම පාලනය කිරීම හා අවදානම අවම කිරීමට රක්ෂණ ක්‍රියාමාර්ග වලට එළඹීම යනුවෙන් හදුන්වා දිය හැක.

ආයතනයක විශේෂයෙන් මුදල් මත ගොඩ නැගී ඇති ස.ණ.ස. බැංකු සමිතිවල අභ්‍යන්තර පාලනක්‍රම කිසිවක් ක්‍රියාත්මක නොවන විට රක්ෂණ ආවරණයකට පැවරීම අසීරුවේ. එහෙයින් විධිමත් පාලනය තුළින් නිසි කළමනාකාරිත්වයෙන් අවදානම පලවා හැරීමට උත්සුක වීම අධ්‍යක්ෂ හෝ කාරකසභාවේ වගකීම වේ.

**හේමසිරි බෙනරගම**

## ආසියාවේ රිදී සීනුව



භක්තිමත් ඇන්ග්ලිකානු කිතුණුවෙකු වූ බණ්ඩාරනායක රටේ මහතාගේ පුත්‍ර රත්නය වූ සොල්මන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක 1899.01.08 වන දින මෝදර දී උපත ලැබීය. ඔහු අධ්‍යාපනය ලැබුවේ ශාන්ත තෝමස් විද්‍යාලයෙනි. ඉංග්‍රීසි, ලතින්, ප්‍රංශ, භෞතික විද්‍යාව, ගණිතය ඔහු වඩාත් ප්‍රියකල විෂයයන් විය. 1915 දී කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලීය විභාගය උසස් ලෙස සමත්විය. පසුව ඔක්ස්පර්ඩ් විශ්ව විද්‍යාලයට ඇතුලත් විය. වසර හයක අධ්‍යාපනය නිමවා 1925 දි ලක්බිමට පා තැබුවේ බැරිස්ටර් වරයෙකු වශයෙනි. අත්තනගල්ල ප්‍රදේශය පුරා පිළිගැනීම් උත්සව රැසක් පැවතිනි. කලගෙඩිහේන උත්සව භූමියේදි මෙතුමා තමාට හරි හැටි සිංහලෙන් කථා කිරීමට නොහැකිවීම ගැන ජනතාවගෙන් සමාව අයැද සිටියේය. ඔක්ස්පර්ඩ් ශිෂ්‍ය සංගමයේ විවිධ නිලතල හෙබවූ එතුමා ඔක්ස්පර්ඩ් සරසවියේ ඉන්දියානු සංගමයේ සභාපතිද විය. වාද විවාද වලදී පෙන්වූ චතුර කථිකත්වය නිසා ඔහුට 'ආසියාවේ රිදී සීනුව' යන නාමය පටබැදුනි. ලංකාවට පැමිණ දුප්පත් ජනතාව වෙනුවෙන් නොමිලයේ උසාවියේ පෙනී සිටියේය. අනතුරුව දේශපාලනයට පිය නැගීය. ජාතික ඇඳුම, සිංහල ජාතිය, බෞද්ධාගම, දේශානුරාගය එතුමා තුල පැවති විශේෂ ලක්ෂණ විය. කම්කරු නායකයෙකු වූ ඒ.ඊ. ගුණසිංහ කම්කරු පක්ෂයට ආරාධනා කළත් වැඩ වර්ජන, උද්ඝෝෂණවලට, විරුද්ධ මතවාදයක් තිබූ බැවින් එකඟ නොවීය. කොළඹ නගර සභා අතුරු මැතිවරණයේදී ගුණසිංහ මහතා පරදා මරදාන නගර සභිකයා ලෙස පත්විය. 1926 පිහිටවූ ජාති හිතෛෂී පක්ෂයේ සභාපතිවුයේය. 1931 දී ලංකා ජාතික පක්ෂයේ සභාපති විය. මෙතුමා ජනතාවාදි සුභ සාධක රාජ්‍ය පාලනය සහ දරිද්‍රතාවය දුරලා, මැද පිළිවෙත අනුගමනය කලේය. 1934.05.19 දී සිංහල මහා සභාව පිහිටුවන ලදී. එය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තිඹිරිගෙයයි. 1935 දී ලංකා සමසමාජ පක්ෂය පිහිටවූ අතර, මාක්ස්වාදියෙකු හෝ විප්ලවවාදියෙකු නොවූ මෙතුමා එයට සම්බන්ධ නොවීය.

1936 දී රාජ්‍ය මන්ත්‍රන සභාවේ වේයන්ගොඩ මන්ත්‍රීවරයා ලෙස නිතරඟයෙන් පත්විය. 1940 දී සිරිමා රත්වත්තේ මැතිණිය සමඟ විවාහ වූ අතර එය උඩරට රදළ පරම්පරාව දේශපාලනික වශයෙන් සම්බන්ධකර ගැනීමකි. 1940 පිහිටවූ ජාතික සංගමයේ ඩී.එස්. සේනානායක මහතා සභාපති වූ අතර උපසභාපති ධූරයට පත්වුයේ බණ්ඩාරනායක මහතාය. අමද්‍යප ව්‍යාපාරය, භාෂා උද්ඝෝෂන ජාතික ව්‍යාපාරය ඇතුලු විවිධ මතධාරීන් එකතුවීමෙන් 1947 මැතිවරණයට ඉදිරිපත්ව ආසන 95න් 43ක් දිනාගැනීමට හැකිවිය. 1948.08.18 පළාත් පාලන ඇමතිධූරයට පත්විය. ලංකාවේ පැවති අර්ධ සන්ධීය රාජාණ්ඩුක්‍රමයක් මිශ්‍ර ගම්මුලාදැනි පාලනයක් බවට එතුමා ප්‍රකාශ කර තිබේ. ගම්මුලාදෑනි ක්‍රමය එතුමා විසින් සංශෝධනය කරන ලදී. 1950.10.16 දි පාර්ලිමේන්තුවේ සභානායක ලෙස පත්විය. 1956.04.12 දින රටේ අගමැති බවට පත්විය. නව දේශපාලන රැල්ලක් සමග එතුමාගේ ව්‍යාපාරය සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු පංච මහා බලවේගය සහ තරුණ ව්‍යාපාර ඒකරාශි කරගැනිමෙන් සිදුවිය. පළමු අගමැති සම්මේලනයේදී සමකාලීන අගමැතිවරුන් වූ ශ්‍රී නේරු (ඉන්දියාව) ඊඩ්න්(එංගලන්තය), කීර්තියට පත් බැරිස්ටර්වරු සමග එක්ව කටයුතු කිරීමෙන් ජාත්‍යන්තර කීර්තියට පත්විය.

1956 ඇතිවූ විප්ලවය මාර්ටින් වික්‍රමසිංහ ගත්කතුවරයා හැඳින්වුයේ බමුණුකුලය බිඳ වැටීමක් ලෙසයි. එතුමා පැය විසිහතරෙන් සිංහල රාජ්‍ය භාෂාව බවට පත්කලේය. ප්‍රගතිශීලි ජනසතු ව්‍යාපාර සහ නව කර්මාන්තශාලා ඉදිකලේය. ගොවියාගේ යහපත සදහා කුඹුරු පනත ගෙනාවේය. වරාය ජනසතු කිරීම, ගමනාගමන මණ්ඩලය පිහිටවීම ඇතුලු විශාල මෙහෙයක් සිදුකලද 1953 ඇතිවූ හර්තාලයේ ප්‍රතිඵල වශයෙන් වරින්වර පැනනැගුණු වැඩ වර්ජන, උද්ඝෝෂන, කැබිනට් මණ්ඩලයේ අර්බුද ඔහුගේ පාලනය අවුල් කලේය. ප්‍රගතිශීලි ඇමතිවරයෙකු වූ පිලිප් ගුණවර්ධන මහතා සහ විලියම් සිල්වා මහතා රජයෙන් ඉවත්විය. පදිංචි රොස්මිඩ් පෙදෙසේ නිවස දේශපාලය වෙනුවෙන් උගස් කලේය. අනුරපුර පූජා භූමි සංවර්ධනය, බුද්ධ ශාසන කොමිසම ක්‍රියාත්ම කිරීම විද්‍යෝදය, විද්‍යාලංකාර පිරිවෙන් විශ්ව විද්‍යාල බවට පත්කිරීම බෞද්ධයන්ගේ ජනාදරයට පත්විය. 'මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීමයි' එතුමාගේ ආදර්ශ පාඨය විය. 1954.10.10 ලක්ෂ 7ක් වූ ඉන්දියානු වතු කම්කරු ප්‍රශ්නයට ඩඩ්ලි, සර්ජෝන්, ශ්‍රී නේරු එක්ව විසදුමකට එළඹුනි. 1959 සැප්තැම්බර් 25 දින සෝමාරාම නමැති චීවරධාරියෙකු මෙතුමාට වෙඩි තබන ලදී. 26 වන දින අභාවප්‍රාප්ත විය. රාජ්‍ය බලය යොදාගෙන නැව් සමාගමක් පිහිටුවා ගැනීමට ඉඩ නොදීම මරණය සිදුකරලීමට හේතුවිය. මරණාසන්නව ජාතිය අමතමින් එතුමා ප්‍රකාශ කලේ අඥාන චීවරධාරියකු තමාට වෙඩි තැබූ බවත්, ඔහුට අනුකම්පා කරන ලෙසත්ය. එතුමාගේ ස්මාරකය ගොඩනැගුවේ පියාගෙන් උරුම වූ හොරගොල්ලේය. රටට දයාද කල අගනා දරුවන් ලෙස හිටපු ජනාධිපතිනය චන්ද්‍රිකා මහත්මිය සහ හිටපු කථානායක අනුර මහතා හැඳින්විය හැක.

**යූ.ඩී.එස්. වීරසිංහ**
**නැ.ඇරැව්වල සණස**

1 පිටුවෙන්...

**සාමාන්‍ය ජනතාවගේ ජීවන ගැටලු විසඳිය හැක්කේ.....**

කිරීමට හෝ අවශ්‍යවන ප්‍රාග්ධනය ලබා දෙමින් කටයුතු කිරීමේ වැදගත් කම අවධාරණය කරවමි.

ඒ සමගම අධ්‍යාත්මික වශයෙන් මිනිසුන්ගේ ගුණ යහපත්කම් වැඩි දියුනුවන ක්‍රියාකාරකම් තව තවත් වර්ධනය කිරීමත් සමාජ පැවැත්මකට අවශ්‍යම වේ ඒ සඳහා ද මෙම සමිති දැනටමත් සැලකිය යුතු මෙහෙයක් කරන අතර, තව තවත් සමාජයීය අවශ්‍යතාවන් ඉටු කිරීම සඳහාත් පියවර ගන්නාමෙන් සිහිපත් කරමු. ගම කේන්ද්‍රය කරගත් සණස සමිතියට මෙය හොඳින්ම කළ හැකි වන අතර, අවශ්‍යවන්නේ ඒ සඳහා කැපවීම සහ අවංක භාවයයි. අවශ්‍ය මගපෙන්වීම, මැදිහත්වීම දිසා සංගමය මව් සංගමය ලෙස පෙනී සිටිනු ඇත.

මාධ්‍යය මගින් මේ සඳහා දායකත්වයක් ලබා දිය හැකි නමුත් සියල්ලම ලාභ ඉපයීම ප්‍රමුඛ කරගත් ව්‍යාපාර වී ඇති තැන ආදායමකින් තොරව සමාජ මෙහෙවරට ඇති මැදිහත්වීම අල්පවී ඇත. මේ තත්වයන් රටක සංවර්ධනය අහිතකර ලෙසින් බලපා ඇත්තේ ජීවන ගැටලුවලට මුහුණ පා සිටින බහුතරයක් වෙසෙන ඌන සංවර්ධිත රටවලටය. අද ආදායමකින් තොරව මෙහෙයක් කරනු ලබන්නන් විරල වුවත් සණස සමිතිවල නායකයින් සිය සමාජ මෙහෙය ඉටු කරනු ලබන්නේ සිය යුතුකමක් හා වගකීමක් කර ගනිමින් නිරාමිසවමය. මොවුන් දිරි ගැන්වීමෙන් මෙන්ම මෙම සමාජ මෙහෙය ප්‍රචලිත කිරීමෙන් පවා මේ සඳහා අන් අය පොළඹවා ගැනීම ද සමාජ හිතකරවේ.

1 පිටුවෙන්... **කොටස් හිමියන්ට තුට්ටුවකවත් ලාබයන් නැති**

සමුපකාරයට නොවන මුදල් ලබා ගනිමින්, එම ස.ණ.ස සමිති හරහා වරප්‍රසාද නොලත් ජනතාවගේ අභිවෘද්ධියට එම මුදල් යෙදවීමේ අරමුණින් ස.ණ.ස. සමිතිවල මූලධනයෙන් ස්ථාපිත වූ බැංකුව SDB නමින් දැන් හැඳින්වෙන, තාත්තගෙන් පස්සේ දුව ඉන්පස්සේ පුතාට ද බෑනාට ද වෙනත් කොටස් හිමියෙකුට පාලනය හිමිවන්නේදැයි අප නොදන්නා පුද්ගලික බැංකුවකි. ඔවුන් සියලු වරප්‍රසාද ලබන්නේ ඔවුන් යොදවන ලද කොටස් මුදලේ බලයෙන් නොව අහිංසක සමුපකාරියාගේ මුදලේ බලයෙනි. එදා අප සම්මත කළ ව්‍යවස්ථාවලිය දැන් නැත.

ලංකාවේ ඉහළම බැංකුවත් වෙනත් ඉහල පුද්ගලික බැංකුත් සිය සාමාන්‍යාධිකාරීවරයාගේ වැටුප ලක්ෂ 10 කට වඩා වැඩියෙන් නොවන මේ කාලයේ SDB එකේ සාමාන්‍යාධිකාරී වරයාගේ පැකේජය වන්නේ මසකට ලක්ෂ 25 ක වැටුපක්, බෙන්ස් කාර් රථයක් හා සියලු වියදම් දැරීම ප්‍රී ක්‍රෙඩිට් කාඩ් එකක් ය. ඉහළම මට්ටමේ අයට ද ඊට සාපේක්ෂව වැටුප් දී ඇතත්, බැංකුවේ ඉලක්ක ඉටුකිරීමට කැපවෙන වෙසෙන මට්ටමේ අයට වැඩිවීමක් නැත. ප්‍රශ්න ගැන කථා කිරීමට වඩා වාරණය කිරීම ඔවුන්ගේ අවියයි. කොටස් කරුවන්වූ අපට තුට්ටුවකවත් ලාභයක් නැත. සමුපකාරයේ නිර්මාතෘවරුන් යයි ප්‍රචලිත අයගේ සමුපකාර භාවිතයන් මේවාය. මෙය සමුපකාර බැංකුවක්නම් වන්නේම නැත.

තවත් සඳහන් කළ යුතු දෙයක් ඇත. මා නායකත්වය දරණ දිසා සංගමය කොළඹ දිසාවේ සමිති ප්‍රවර්ධනයේ කැපවන මවු සංගමයයි. එසේ පිළිගනිමින්ම අප කෙරෙහි විශ්වාසයක් නොතබා වෙනත් බැංකු වෙත සිය මුදල් ආයෝජනය කරන සාමාජික සමිති, සිය සාමාජිකයාට කියන්නේ තමන්ට ඉතුරු කළ හැකි හැම මුදලක්ම තම සමිතියේ තැන්පත් කරන ලෙසටයි. මා මගේ සාමාජික සමිති වලට කියන්නේ ද එයමයි.. ඔබේ සමිති කෙරෙහි සාමාජිකයා විශ්වාසය තබනවා මෙන්ම සාමාජික සමිතිය ද අප කෙරෙහි විශ්වාසය තැබීම වචනයට සීමා කිරීමෙන් නොව භාවිතයෙන් පෙන්නුම් කළ යුතුවේ. මගේ වැඩි මැදිහත්වීම විය යුත්තේ අප කෙරෙහි විශ්වාසය භාවිතයෙන් පෙන්වන්නට පමණි.

එරන්දි මධුෂිකා

## උපමා කථා

මැලේසියාවේ වෙල් යායක් අද්දර ගෙයක් හදාගෙන එක්තරා ගොවිමහතකු ජීවත් වුනා. දිනක් රාත්‍රියේ මහා වැස්සක් ඇද හැළුනා. වැස්සෙන සතුටට පත් වෙලේ සිටි හැලගෙම්බන් එක දිගට ම හඬ නගා කෑගසන්න පටන්ගත්තා. ගෙම්බන් ටි දෙනෙකු කෑගැසුවද, හඬ නඟන විලාසය අනුව ඉතා විශාල ගෙම් පිරිසක් කෑගසන බවයි. සිතෙන්නේ. ඉතින් මුළු රාත්‍රියම නිදි නොලබා සිටි ගොවිමහතා, උදේ ආහාරය සඳහා ලඟ ඇති කඩයකට ගියා. මෙහිදී ඉඳිආප්ප සමග හොද්දක් ලැබුනා. ඉතා රසවත් මෙම හොද්ද මොනවද කියල ඇසුවම කඩ හිමියා කීවා ගෙම් හොද්දක් බව. ගොවියා ඇසුවා 'ගෙම්බන් ගෙනත් දුන්නොත් ගන්නවා ද ' කියා. කඩ හිමියා කීවා හොඳ මිලකට ගන්න බව. ගොවියා ඉතා සතුටින් ගෙදර ගොස් ගෙම්බන් අල්ලන උපකරණයක් ද ඇතුව වෙලට ගොස් බොහෝ වේලා උත්සාහ කර ගෙම්බන් දහ දෙනෙකු පමණ අල්ලාගත්තා. කඩ හිමියාට දී හොඳ මුදලක් ලබාගත්තා. එදින රාත්‍රියේ වැස්ස නමුත් ගෙම්බන් කෑ ගැසුවේ නැහැ. ඕනෑම තැනක අනවශ්‍ය ගෙම්බන් ඉවත් කළ විට කරදරයක් නැහැ.

දිනක් දහඩිය සලමින් ගල් කොරියක ගල් කඩන මිනිසකු හීනෙන් දැක්කා රජතුමා දෝලාවක හිඳුවාගෙන යන පෙරහැරක්, මේ මොහොතේ අර ගල් කඩන මිනිසාට සිතුනා, අනේ මටත් රජකම ලැබුනොත් කොච්චර හොඳ ද කියලා. එවිටම මිනිසා රජ වුණා. දෝලාවෙන් යනකොට දහඩිය වැගිරෙන්න කොට හිතානා අනේ දහඩිය දමන්නේ රජතුමාට වඩා බලවත් ඉර කියලා අනේ මටත් ඉර වුනොත් කොච්චර හොඳද කියලා. එවිටම ගල් කම්කරුවා ඉර වුනා. දැන් ටිකාක් දුර යන ඉර වලාකුලකට වැසුනා. මෙහිදී ගල්කරුවා සිතුවා ඉරට වඩා වලාකුල බලවත් මට වලාකුල වුනා නම් කොච්චර හොඳද කියලා. එවිටම ඔහුව වලාකුල බවට පත්වුනා. ටික දුරක් යන වලාකුල සුලඟකට අසුව ගසාගෙන ගියා. එවිට ගල්කරුවා සිතුවා වලාකුලට වඩා සුලඟ බලවත් මට සුලඟ වුනා නම් කොච්චර හොඳ ද කියා. එවිටම ගල්කරුවා සුළඟ වුනා. ටික දුරක් සුලග හමා ගොස් ගල්කරුවා වැඩ කල මහා කළුගල් කන්දේ හැපුනා. එවිට ඔහු නින්දෙන් අවදිවුනා. ඔහුට එවිට ගල් කඩන හඬ ඇසුනා. සිහින ලෝකවලින් මිදී සැබෑ ලෝකයේ ජීවත්වීම අගෙයි.

දොන් ජයපාල විජේරත්න - සී.ස. වැලිවිට මාලබේ සණස

## මාසික තිළිණය

ස.ණ.ස. කොළඹ පුවත් මාසික ප්‍රශ්ණයට කූපනය මගින් ඔබ සපයන, නිවැරදි පිළිතුරට තිළිණයක් පිරිනැමීමට කටයුතු සම්පාදනය කර ඇති බව සතුටින් දන්වමු.

ඔබ ජයග්‍රහකයෙක් නම්, ඔබේ සමිතියේ හා පෞද්ගලික අනන්‍යතාවය තහවුරු කරවා එම තිළිණය දිසා සංගමයෙන් ලබාගන්න.

සංස්කාරක මණ්ඩලය

## කියවන්න... දැනුම ලබන්න....
### ත්‍යාගයට තෑගි ගන්න ....

ඔබ කළ යුත්තේ මෙහි පළවන ප්‍රශ්ණයට පිළිතුර කූපනයේ පුරවා තැපැල් පතක අලවා සණස පුවත් කොළඹින් අංක 220/1, හයිලෙවල් පාර, වත්තේගෙදර, මහරගම වෙත 2020 අප්‍රේල් 15 ට පෙර එවීමයි. ජයග්‍රාහකයින් රැසක් සිටියහොත් කුසපත් ඇදීමෙන් වාසනාවන්තයා තෝරා ගනු ලැබේ.

**ප්‍රශ්ණය :- ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම කිනම් දිනක පැවැත්වේද?**

**කූපන් තරගයේ ජයග්‍රහණය**

**කූපන අංක 01**

**එම්.ඒ. නාලිකා මිය**
**සී.ස. මල්වත්ත සණස සමිතිය**

**කූපන් අංකය 03**

මුලකුරු සමග නම: ..........................................................

ස්ථිර ලිපිනය: ..........................................................

..........................................................

දුරකථන අංකය: ..........................................................

පුරුදු අත්සන: ..........................................................

සණස සමිතියේ නම: ..........................................................


..........................................................

පිළිතුර: ..........................................................

..........................................................

## සුභ උපන්දිනයක් වේවා !!

**කරගම්පිටිය සමිතියේ පසුගිය මස උපන් දිනය සැමරූ අය**


කේ. පුෂ්පකුමාර


ආර්. හෙට්ටිආරච්චි


පී.ජී. ආරියවතී


එස්. ප්‍රනාන්දු


ලලිතා පෙරේරා


ඩබ්.එම්. ප්‍රනාන්දු


අනුලා කරුණාසිංහ


අජිත් ප්‍රේමලාල්


ලක්ෂ්මී රාජපක්ෂ


එල්. ප්‍රියන්ති


මේරි ක්ලැරිස්


එල්. වීරරත්න


එස්. කොඩිකාර


සී. ශිරෝමාලා


දීපා ප්‍රියදර්ශනී

# හෙට දවස වෙනුවෙන්.....

## සරු අස්වැන්නක් උදෙසා අද දින ඉතිරි කරමු.

### ඔබගේ තැන්පතුවට ඉහල වටිනාකමක්

**ඔබගේ අනාගත අපේක්ෂාව වෙනුවෙන්**

- සාමාජික ඉතිරිකිරීම්
- සාමාජික ස්ථාවර තැන්පත්
- දහස්පියලි ඉතිරිකිරීම්

## සාමාජික ණය

**සෙවණ ණය**
සණස සමිති සදහා ඉඩම් හා ගොඩනැගිලි මිලදී ගැනීම, ගොඩනැගිලි ඉදිකිරීම, කාර්යාල උපකරණ හා පරිඝණක මිලදී ගැනීම, සේප්පු මිලදී ගැනීම, ආදී වත්කම් වර්ධනය කිරීමේ කාර්යයන් වෙනුවෙන් සණස නිවහනට සෙවනක් සලසනු පිණිස මෙම ණය මුදාහරිනු ලැබේ.

**ප්‍රාර්ථනා ණය**
ගෞරවනීය සණස සාමාජිකයින්ගේ සියලු ප්‍රාර්ථනා මල්ඵල ගන්වනු පිණිස ඔවුන්ගේ සියලු අවශ්‍යතා ඉටුකරවනු පිණිස ද ණය ඉල්ලුම් කළ හැක.

**ලියසවිය ණය**
සණස සාමාජික දිරිය කතුන්ගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් ස්වයංරැකියා ආරම්භ කිරීම හෝ වැඩි දියුණු කිරීම සහ යතුරුපැදි මිලදී ගැනීම ආදි කටයුතු වෙනුවෙන් ඔවුනට සවියක් වනු පිණිස මෙම ණය මුදා හරිනු ලැබේ.

**සහජීවන ණය**
සණස සාමාජික සාමාජිකාවන්ට සැබෑ ජීවන සහකරුවෙකු වෙමින් ඔවුන් හා ඔවුන්ගේ පවුල්වල ජිවන මට්ටම ඉහළ නංවනු පිණිස ඔවුන්ගේ උසස් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් සිදුකළ යුතු මුල්‍ය අවශ්‍යතාවන් හෝ වෙනත් සඵලදායී මුල්‍ය ගණුදෙනු පියවීමේ අවශ්‍යතා පරිපුර්ණ කිරීමට හා වෙනත් ඕනෑම අවශ්‍යතාවයක් සඳහා කොටස් හෝ දේපල ඇප මත මෙම ණය මුදාහරිනු ලැබේ.

**අභිමාණ ණය**
සණස අභිමානය නිරන්තරයෙන් සුරක්ෂිත කරනු පිණිස සණස සමිතිවල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වේගවත්ව හා සුහදශිලිව විසදුම් ලබා දෙනු පිණිස මෙම ණය මුදා හරිනු ලැබේ.

**අධ්‍යාපන ණය**
සණස දුවා දරුවන්ගේ නැණ නුවණ පහදමින් ශ්‍රී ලාංකීය ශ්‍රේෂ්ඨ පුරවැසියන් කරනු පිණිස සණස දුවා දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා මෙම ණය මුදා හරිනු ලබයි.

**උත්සව ණය**
උත්සව සිරියට මුල්‍යමය දිරියක් ලබා දෙමින් ශ්‍රී ලාංකීය සුවිශේෂිත වු උත්සව අවශ්‍යතා සඳහා මෙම ණය මුදා හරිනු ලබයි.

**අයිරා ණය**
අනාගතයකදී ඇතිවිය හැකි ද්‍රවශීලතා ගැටලු වෙනුවෙන් වර්තමානයේ අනුමත කර තබා ගතයුතු ඕනෑම අවස්ථාවක ප්‍රතිපුර්ණය කිරීමේ හැකියාව ඇති ණය ක්‍රමයකි.

## උත්සව ණය

**2020**
**මසකට පොලිය 1.08 යටතේ**
**උපරිම වාරික 10 කින්**
**ගෙවීමේ පදනම මත**
**උත්සව ණය**
**දැන් අයදුම් කළ හැක.**

ඔබට අවශ්‍ය ලිපිද්‍රව්‍ය
අපගේ ප්‍රධාන කාර්යාලයෙන්
හෝ
ශාඛා කාර්යාල
මඟින් දැන් ලබාගත හැක...

## කඩිනම් හා මිත්‍රශීලි සේවය

කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13ක් ආවරණය වන පරිදි පර්ෂද 31 ක් මගින් අඛණ්ඩව සිදුවන සණස සමිති බල ගැන්වීමේ ක්‍රියාන්විතය

**අපගේ ශාඛා කාර්යාල**

| | |
|---|---|
| හෝමාගම | - 0112 748 774 |
| මීපේ | - 0112 858 302 |
| අතුරුගිරිය | - 0112 760 636 |
| පිළියන්දල | - 0112 608 318 |
| කොලොන්නාව | - 0112 572 790 |

*අනෙකුත් ආයතනික කොන්දේසි වලට යටත්වේ.*

ස.ණ.ස.


## සී.ස. කොළඹ දිස්ත්‍රික් සණස සමිති සංගමය
220/1 හයිලෙවල් පාර, මහරගම.
දුරකථන : 0112 851213, 0114 301228, 0113 034347, 0113 699600
ෆැක්ස් : 0114 301 228, 0112 848 801
ඊ-මේල් : sanasacol.marketing@gmail.com Web: www.sanasacolombo.lk
colombo district sanasa union ltd


*සාමාජිකත්වයේ ශක්තිය, සංවිධානය ස්ථාපනය වීම තුළින්, පිළිබිඹු වේ.*